# බස්නාහිර පළාත් සභාවේ 2003
# අංක .........04............. දරණ පෙර පාසල්
# පිළිබඳ ප්‍රඥප්තිය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බස්නාහිර පළාත් සභාවට පැවරී ඇති විෂයන්ට අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහාද, බස්නාහිර පළාත තුළ දැනට පවත්වා ගෙන යනු ලබන පෙර පාසල් ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය කිරීම හා මෙහෙය වීම සඳහාද නව පෙර පාසල් පිහිටුවීම සඳහාද 1990 අංක 05 දරණ අධ්‍යාපන ප්‍රඥප්තියේ 05 වන කොටස පරිච්ඡින්න කිරීම සඳහාද ඊට ආනුෂාංගික කාරණා සඳහාද වූ විධිවිධාන සැලැස්වීම සඳහාද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ. *(පැනවීම)*

01. මෙම ප්‍රඥප්තිය 2003 අංක .........04.......... දරණ බස්නාහිර පළාතේ පෙර පාසල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන දිනක සිට එය ක්‍රියාත්මක වේ. *(ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.)*

## I කොටස
## අරමුණු

02. දරුවකුගේ පෙර පාසල් අවදිය වශයෙන් සැලකෙන අවුරුදු 3 සිට අවුරුදු 5 සම්පූර්ණ වන තෙක් කාලසීමාව තුළ ළමාවිය සංවර්ධනය සඳහාත් නිසි මගපෙන්වීම සඳහාත් වූ පහත සඳහන් පරමාර්ථයන් ඉටු කිරීම මෙම ප්‍රඥප්තියේ අරමුණු වේ. *(අරමුණු)*

(අ) ඉන්ද්‍රියන් ඇසුරින් අත්දැකීම් ලබා ගැනීමට හැකි හිතකර සාරවත් ආරක්ෂා සහිත පරිසරයක් සැපයීම.

(ආ) එදිනෙදා ක්‍රියාකාරකම් තුළින් යහපත් ආචාරශීලී හැසිරීම් රටාවක් සංවිධානය කර ගැනීමට සහ ප්‍රියමනාප කතා බහට හුරුවීමට අවස්ථාවක් ලබා දීම.

(ඇ) මනා සෞඛ්‍ය පුරුදු හුරුකර ගැනීමට මගපෙන්වීම.

(ඈ) යහ ගුණ වගාකර ගැනීමට හිතකර පරිසරයක් සැපයීම.

(ඉ) ශාරීරික වර්ධනය හා හසුරු කුසලතා සංවර්ධනයට අවස්ථා සැලසීම.

(ඊ) බුද්ධිමය නිර්මාණශීලී හැකියා සංවර්ධනය කිරීම.

(උ) පරිසරයට ආදරය කිරීම හා ඒ තුළින් වින්දනයක් ලබා ගැනීමට පරිසරය අගය කිරීමට හා පරිසරය ආරක්ෂා කිරීමට මගපෙන්වීම.

(ඌ) අභියෝගාත්මක අවස්ථාවන්ට මුහුණ දීමේ හැකියාව ලබා දීම.

(එ) සහජීවනයෙන් කටයුතු කිරීමට හුරු කෙරෙන සුහද වාතාවරණයක් ගොඩනැංවීම.

(ඒ) දරුවාට මුල් ළමාවිය සතුටින් හා විනෝදයෙන් ගත කිරීමට ඉඩ සැලසීම.

(ඔ) මෙම වයසේ ළමුන්ගේ හැකියාවන් අවදි කිරීම හා පෝෂණය කිරීම සඳහා සුදුසු පරිසරයක් ඇති කිරීම.

(ඕ) ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපනය උදෙසා ශක්තිමත් අත්තිවාරමක් ලබා දීම.

3

## II කොටස
## පරිපාලනය හා අධීක්ෂණය කිරීම

03. අමාත්‍යවරයා විසින් නමින් හෝ නිළ නාමයෙන් (මෙහි මින්මතු නිසි බලධරයා යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම ට නිසි බලධරයා ලෙස පත් කළ යුතුය. නිසි බලධරයකු පත් කිරීම.

04. මේ ප්‍රඥප්තියේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් යටතේ තමා වෙත පවරා දෙනු ලබන යම් බලතල කාර්ය හා කර්තව්‍ය බලධරයා විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතුය.

05. මේ ප්‍රඥප්තිය යටතේ තමා වෙත පවරා දෙන ලද හෝ වෙන් කොට දෙන ලද බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් බලධරයා විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව වෙනත් යම් පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයකුට පවරා දෙනු ලැබිය හැකිය. නිසි බලධරයා විසින් බලය පැවරිය හැකි බව.

06. අමාත්‍යවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව නිසි බලධරයා විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ඉටු කළ යුත්තේය.

(අ) පළාත තුළ ඇති පෙර පාසල් පැවැත්වෙන ස්ථානයකට ඇතුළු වීම පරිශ්‍රය හා අදාළ ලිපි ලේඛන පරීක්ෂා කිරීම.

(ආ) පෙර පාසල් හිමිකරුවන්ගෙන් හෝ ඒවා පවත්වනු ලබන අයගෙන් හෝ ඒ අවස්ථාවේ එහි සිටින පෙර පාසල් පරිපාලන කටයුතු වලට සම්බන්ධ වූ ඕනෑම අයකුගෙන් ප්‍රශ්න කිරීම හා පැහැදිලි කිරීම් ලබා ගැනීම.

(ඇ) යම් පෙර පාසලක් ලියාපදිංචි කිරීම හෝ හේතු දක්වා ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම.

(ඈ) පෙර පාසල්වල ඉගැන්වීමේ කටයුතු කරන හෝ යෙදී සිටින භාරකරු අයිතිකරුගේ හා ගුරුවරුගේ සුදුසුකම් සනාථ කිරීමට ඉල්ලා සිටීම හා එවැනි අවස්ථාවකදී එම සහතික ලබා ගැනීම, පරීක්ෂා කිරීම සහ ඒවායේ සත්‍ය පිටපත් ලබා ගැනීම.

(ඉ) ඕනෑම පෙර පාසලකට අයත් ලේඛන, පොත්පත්, සටහන්, වාර්තා හා ගොනු ආදිය පරීක්ෂා කිරීම හා අවශ්‍ය වුවහොත් භාරයට ගැනීම.

(ඊ) අවම සුදුසුකම් සනාථ කිරීමට අයමත් පෙර පාසලක ඉගැන්වීමේ යෙදෙන්නන්ගේ සේවය අත්හිටුවීමට හා නතර කිරීමට පියවර ගැනීම.

(උ) යම් පෙර පාසලක ඉගෙන ගන්නා දරුවන්ට මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති අවම පහසුකම් ලබා දෙන ලෙස ඒ පෙර පාසල පවත්වා ගෙන යනු ලබන අයට හෝ හිමිකරුට නියම කිරීම.

(ඌ) පවත්වනු ලබන ඕනෑම පෙර පාසලක් පරීක්ෂණයකින් පසුව එම පෙර පාසැල මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධානයන්ට අනුව පවත්වාගෙන නොයන්නේ නම් එම පෙර පාසල පවත්වා ගෙන යැම නතර කිරීම හෝ අත්හිටුවීම.

(එ) පෙර පාසල් විසින් පවත්වනු ලබන සේවා පහසුකම් හා කාර්ය මණ්ඩල ආදිය සැලකිල්ලට ගෙන ශ්‍රේණිගත කිරීම.

(ඒ) නිසි බලධරයා විසින් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට බස්නාහිර පළාත තුළ පෙර පාසැල් ළමුන් සඳහා අධ්‍යාපනය ලබා දීමේ අරමුණ ඇතිව පෙර පාසල් නමින් පිහිටුවා ඇති සියලුම ආයතනයන් පිළිබඳ ලේඛනයක් සකස් කළ යුතු අතර, එම ලේඛනයට එම ආයතනයේ නම, ලිපිනය, පවත්වා ගෙන යන අයිතිකරුගේ හෝ කළමනාකරුගේ නම සහ ලිපිනයන් ශිෂ්‍ය සංඛ්‍යාව ආදි තොරතුරු ඇතුළත් විය යුතුය.

(ඔ) පෙර පාසල්වල උගන්වනු ලබන ගුරුවරු, ගුරුවරියන්, කාර්ය මණ්ඩලයට පුහුණු වැඩ සටහන්, සම්මන්ත්‍රණ, හා වැඩම ළු පැවැත්වි ම හා එයට සහභාගි වීමට පෙර පාසල්වල උගන්වන ගුරුවරු, ගුරුවරියන් ට හා වෙනත් සම්බන්ධ අයවලුන්ට නියම කිරීම.

(ඕ) පෙර පාසල් කලින් කලට අධීක්ෂණයට හා පරීක්ෂණයට ලක් කිරීම.

(ක) පෙර පාසලක පවත්වා ගෙන යා යුතු පොත්පත්, ලේඛන හා ආකෘතිපත්‍ර හඳුන්වා දීම හා ඒවා භාවිතා කිරීමට නියම කිරීම.

## III කොටස
## පෙර පාසල් පිළිබඳ
## උපදේශක කමිටුව පත් කිරීම

07. (1) පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත මෙහි මින්මතු "උපදේශක කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන පෙර පාසල් උපදේශක කමිටුවක් අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය. පෙර පාසල් උපදේශක කමිටුව

(අ) පෙර පාසල් මධ්‍යස්ථාන උපදේශක කමිටුවට පහත සඳහන් සාමාජිකයන් නිල බලයෙන්ම සාමාජිකයන් විය යුතුය.

i. පළාත් අධ්‍යාපන ලේකම්
ii. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
iii. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
iv. පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස්
v. පළාත් පාලන කොමසාරිස්

(ආ) මෙයට අමතරව පහත සඳහන් නියෝජිතයින්ද සාමාජිකයින් ලෙස පත් කළ යුතුය.

i. ජාතික ළමා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ හෝ නියෝජිතයකු
ii. පෙර පාසල් විෂයට අදළ කටයුතු කරනු ලබන ස්වේච්ඡා සංවිධානයකින් තෝරා ගත් නියෝජිතයකු
iii. පෙර පාසල් වියේ ඉගෙනුම ලබන දරුවකුගේ දෙමාපියන්ගෙන් අයෙකු

08. (2) නිල බලයෙන් පත්වන අය අතුරින් උපදේශක කමිටුවේ සභාපති පළාත් අධ්‍යාපන ලේකම් විය යුතු අතර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නිසි බලධාරියා මෙම කමිටුවේ ලේකම් විය යුතුය. සභාපති/ ලේකම් පත් කිරීම

(3) උපදේශක කමිටුවේ රැස්වීමේ ගණ පූරණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(4) පත් කළ සාමාජිකයකු මිය යෑමෙන්, ඉල්ලා අස් වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය අත්හලොත් මිස වසර දෙකක කාලයක් ධුරය දැරිය යුතුය.

(5) පත් කළ සාමාජිකයකු පිළිගත හැකි හේතුවක් ලෙස උපදේශක කමිටුව විසින් සලකන යම් හේතුවක් නොමැතිව සභාවේ රැස්වීම් තුනකට පිට පිටම නොපැමිණියහොත් එම සාමාජිකයා ධුරය අත්හැර ගිය අයකු ලෙස සලකනු ලැබිය යුතුය.

(6) අමාත්‍යවරයා විසින් ඕනෑම අවස්ථාවක උපදේශක කමිටුවේ පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(7) පත් කළ සාමාජිකයකු විසින් තමා ධුරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(8) පත් කළ සාමාජිකයකු මිය යාමෙන් ඉල්ලා අස්වීමෙන් ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍ය ආකාරයකින් ධුරය හිස් වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 7 (1) (අ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයකු වශයෙන් වෙනත් තැනැත්තකු පත් කළ යුතුය. එම සාමාජිකයා වෙනුවට පත් කරනු ලැබූ යම් අනුප්‍රාප්තිකයකු විසින් තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතුය.

09. *උපදේශක කමිටුව කාර්ය පටිපාටි සකස් කළ යුතු බව.*

i. ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානයන්ට යටත්ව රෙගුලාසි මගින් රැස්වීම් හා වෙනත් අදාළ කරුණු සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටි උපදේශක කමිටුව විසින් සකස් කර ගත යුතුය.

ii. උපදේශක කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස් විය යුතුය.

iii. උපදේශක කමිටුවේ පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමේ අඩුපාඩුවක් හේතු කොට ගෙන උපදේශක කමිටුවේ තිරණ කෙරෙහි එකී අඩුපාඩුව බලනොපෑ යුතුය.

10. *උපදේශක කමිටුවට පත් විමට නුසුදුසුකම්*

යම් තැනැත්තෙක්

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එසේ පත් වුවහොත් හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකු වී සිටීම නතර වුවහොත් හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකල් බවට හෝ වස්තු බංකොලොත් භාවයට පත් වී සිටින බවට ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම් හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳි නම් හෝ විඳ ඇත්නම් හෝ

(ඉ) උපදේශක සභාවේ සාමාජිකයකු වශයෙන් ඔහු විසින් ඔහුගේ කාර්යයන් ඉටු කිරීමේදී හානි කර ලෙස බලපෑමට ඉඩ තිබෙන යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් දරයි නම් හෝ

(උ) මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබුවහොත් හෝ උපදේශක කමිටුවේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු විය යුතුය.

11. උපදේශක කමිටුවේ පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමේ අඩුපාඩුවක් හේතු කොට ගෙන එමගින් ගනු ලබන තීරණයක් හෝ ගනු ලබන ක්‍රියාවක් අවලංගු නොවිය යුතුය.

12. උපදේශක කමිටුව විසින් පහත දැක්වෙන කාර්ය හා කර්තව්‍ය ඉටු කළ යුතුය. උපදේශක කමිටුවේ කාර්ය කර්තව්‍ය

(අ) පෙර පාසල් සම්බන්ධයෙන් අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට අදාළ වන නියෝග සකස් කිරීම. එම නියෝග අමාත්‍යවරයා මගින් පළ කරවීම.

(ආ) පෙර පාසල් කටයුතුවලට අදාළ සියලු අංශයන්ගෙන් ඉටු විය යුතු කාර්ය භාරය හඳුනාගැනීම සහ ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් සකස් කිරීම, උපදෙස් දීම, පසුවිපරම් කිරීම, අධීක්ෂණය කිරීම හා ඊට අදාළ උපදෙස් වරින් වර නිකුත් කිරීම.

(ඇ) පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි ලියාපදිංචි පෙර පාසල්වල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම. පෙර පාසල් විෂයට අදාළ විෂය නිර්දේශයන් නියම කිරීම, සංශෝධනය කිරීම හා ඊට අදාළ වෙනත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

(ඉ) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමුන් හඳුනාගෙන ඔවුන්ට ගැලපෙන සේ ඉදිරි අධ්‍යාපන වැඩ සටහන් සකස් කිරීම හා එම ළමුන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමටත් දරුවන්ගේ වර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සකස් කරවීමට පියවර ගැනීම.

(ඊ) මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියාකාරකම් සිදු කරන හා පවත්වා ගෙන යන පෙර පාසල් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග නිශ්චය කිරීම.

(උ) පෙර පාසල් ලියාපදිංචි කිරීම පිළිබඳ ලැබෙන අභියාචනා පිළිබඳ සොයා බලා ගරු අමාත්‍යතුමාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

(ඌ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිසි බලධාරියා වෙත උපදෙස් නිකුත් කිරීම.

(එ) බස්නාහිර පළාතේ සියළුම පෙර පාසල් සඳහා භාවිතා කළ යුතු විෂය මාලාවක් උපදේශක කමිටුවක් විසින් සකස් කළ යුතුය. පෙර පාසල් විෂය මාලාව

## IV කොටස
## පෙර පාසල් සඳහා ප්‍රමිතීන්

13. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පහත සඳහන් මූලික හා අවම පහසුකම්වලින් සමන්විත විය යුතුය. පෙර පාසල්වල තිබිය යුතු මූලික හා අවම පහසුකම්.

(අ) එක් දරුවකු සඳහා අවම වශයෙන් වර්ග අඩි 10 ක ගොඩනැගිලි ඉඩකඩ වෙන් කර තිබීම.

`ත් 25 කට එක් වැසිකිලියක් බැගින් වැසිකිලි පද්ධතියක් සකස්

කර තිබීම.

(ඇ) ගොඩනැගිල්ලේ කාමර වර්ග ප්‍රමාණයෙන් 1/7 ක් වන පරිදි වාතාශ්‍රය සැපයෙන් පරිදි දෙර ජනෙල් සකස් කළ යුතුය.

(ඇ) ආරක්ෂිත තාප්පයකින් හෝ ආරක්ෂිත වැටකින් පෙර පාසල් භූමිය මැනවින් ආරක්ෂා කර තිබීම.

(ඉ) උපදේශක කමිටුවේ උපදෙස් පරිදි ප්‍රථමාධාර පෙට්ටියක් පවත්වා ගෙන යෑම.

(ඊ) පෙර පාසල් භූමිය හෝ පෙර පාසල් ගෙවත්ත ප්‍රසන්න පරිසරයකින් සකස් කර තිබීම හා උපදේශක කමිටුව විසින් නියම කරනු ලබන ආකාරයට මූලික ක්‍රීඩා පහසුකම් ඇති කිරීම.

(උ) සෑම මධ්‍යස්ථානයකටම ක්‍රීඩා කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගෙමිදුලක් තිබීම.

(ඌ) සාමාන්‍ය ශිෂ්‍යයන් සඳහා 20:1 අනුපාතයට ගුරුවරියන් සිටීම සහ විශේෂිත ළමුන් සඳහා 5:1 අනුපාතයට ගුරුවරියන් සිටීම.

(එ) ප්‍රමාණවත් පරිදි ලී බඩු උපකරණ තිබීම සහ ඒවා දරුවන්ගේ මානසික ප්‍රබෝදයට ඉවහල් වන ආකාරයට ප්‍රසන්න පෙනුමකින් පවත්වා ගෙන යෑම.

(ඒ) ආගමික වතාවත් කිරීමට සුදුසු ස්ථානයක් සකස් කර තිබීම.

14. හානි කර හෝ අන්තරාදයක කර්මාන්තශාලාවක් පිහිටි ස්ථානයක සිට මීටර් 100 ක් ඇතුළත පෙර පාසලක් ස්ථාපනය නොකළ යුතුය. අන්තරාදයක කර්මාන්ත ශාලා අවට පෙර පාසල් නොපිහිට විය යුතු බව.

15. මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස සෑම පෙර පාසලක් විසින්ම අනුගමනය කළ යුතු ප්‍රමිතීන් කවරේද යන්න අමාත්‍යතුමා විසින් නියෝග මගින් වරින් වර නියම කළ යුතුය. පෙර පාසල් සඳහා සුදුසුකම් හා ප්‍රමිතීන් ඇමතිවරයා විසින් නියම කළ හැකි බව

## V කොටස
## පෙර පාසල් ලියාපදිංචි කිරීම

16. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පසුව පළාත් නිසි බලධරයාගේ අනුමැතිය නොමැතිව පෙර පාසලක් පවත්වා ගෙන යාම හෝ පිහිටුවීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේ ය.

17. ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරනු ලැබ මාස තුනක් ඉකුත් වීමට පෙර සෑම පෙර පාසලකම අයිතිකරු හෝ කළමණාකරු පෙර පාසල ලේඛනගත කරන ලෙස නිසි බලධරයා වෙත ඉල්ලුම් කළ යුතුය.

18. පෙර පාසලක් අළුතින් ඇරඹීමට යෝජිත අවස්ථාවක එය පිහිටුවීමට දින 30 කට පෙර තම යෝජනාව මෙම ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනයේ සඳහන් වන ආකාරයට සකස් කළ අයදුම්පතක් සමග නිසි බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

19. පෙර පාසලක් අළුතින් ඇරඹීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පතෙහි (උප ලේඛන අංක 01 හි සඳහන් කරුණු ඇතුළත් කළ යුතුය.

20. (1) ලියාපදිංචි වීම සඳහා නිසි බලධරයා විසින් නියම කරනු ලබන ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය.

(2) ලියාපදිංචි කිරීමට හා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කළ යුතු කාලය, අවශ්‍ය සුදුසුකම්, අවශ්‍යතා, අදාළ ආකෘති හා ගාස්තු නිසි බලධරයා විසින් කලින් කලට ප්‍රකාශයට පත් කළයුතුය.

(3) ලියාපදිංචි වීමේ හා බලපත්‍ර ලබා ගැනීමේ කාලය දීර්ඝ කිරීම ප්‍රමාද වන කාලය සඳහා දඩ හා අමතර ගාස්තු අයකිරීමට නිසි බලධරයාට බලය ඇත්තේය.

21. බස්නාහිර පළාත තුළ වයස අවුරුදු 3 සිට අවුරුදු 5 දක්වා වූ ළමුන් සඳහා කිනම් ආකාරයක අධ්‍යාපන කටයුත්තක් ඉටු කිරීමේ අරමුණින් පවත්වා ගෙන යන සෑම ආයතනයක්මද, පෙර පාසල් නමින් පවත්වා ගෙන යනු ලබන ආයතනයක්මද, මෙම ප්‍රඥප්තිය යටතේ පෙර පාසලක් ලෙස සැලකේ.

22. ඉහත උපදෙස් කඩ කරමින් යම් පෙර පාසලක් ආරම්භ කරන හෝ යම් අධ්‍යයන පාඨමාලාවක් පවත්වන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මෙම වරද කරන සෑම මාසයකටම රු. 500/- නොවැඩි දඩයකට යටත් වන්නේය.

23. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පෙර පාසැල් නමින් පවත්වා ගෙන යනු ලබන කිසියම් ආයතනයක් ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි නිසි බලධරයා වෙත ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට එම ඉල්ලීම මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල නොවේ නම් ඒ පිළිබඳව හේතු දක්වා ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකිය.

(1) එවැනි ප්‍රතික්ෂේප කිරීමක් කරනු ලබන සෑම අවස්ථාවකම එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතුව ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළත ඉල්ලීම කරනු ලැබූ පෙර පාසලේ අයිතිකරුට හෝ කළමනාකරුට දන්වා යැවිය යුතුය.

(2) එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සිදු වූ අවස්ථාවක එකී පෙර පාසලේ කළමනාකරු හෝ අයිතිකරු විසින් ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත දින 14ක් ඇතුලත අභියාචනයක් කළ හැකිය.

(3) එවැනි අභියාචනයක් ලැබූ විට අමාත්‍යවරයා විසින් උපදේශක කමිටුව වෙත එය යොමු කොට උපදේශක කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගනිමින් එකී අභියාචනය සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුය.

(4) පෙර පාසල් සම්බන්ධයෙන් ඇමතිවරයා ගනු ලබන තීරණය අවසාන තීරණය වන්නේ ය.

24. නිසි බලධාරියා විසින් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනය වන විට පෙර පාසල් වශයෙන් පවත්වා ගෙන ගොස් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව ලියාපදිංචි කරන ලද්දවූ හා ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව අලුතින් පිහිටුවා ලියාපදිංචි වූ පෙර පාසල් සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීමේ ලේඛනයක් එකී මධ්‍යස්ථානවල පාලකයන්ගේ නම් හා ලිපිනයන් සහිතව පවත්වා ගෙන යා යුතුය.

(1) බස්නාහිර පළාතේ සෑම පෙර පාසැලක්ම නිසි බලධරයා විසින් ලියාපදිංචි කළ යුතු අතර, ඒ සඳහා අංකයක් හා ලියාපදිංචි සහතිකයක් ලබා දිය යුතුය.

(2) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ලියාපදිංචි ගාස්තු ප්‍රමාණය සෑම පෙර පාසල් ලියාපදිංචියක් සඳහාම අය කරනු ලැබේ.

## VI කොටස
## පෙර පාසල් පාලිකාවන් සඳහා සුදුසුකම් හා ඔවුන් පුහුණු කිරීම්

25. පෙර පාසල් පාලිකාවන් වශයෙන් කටයුතු කරන ගුරුවරුන් අවම වශයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල, ගණිතය ඇතුළු විෂයන් 06 ක් වත් සමත් විය යුතු අතර, පිළිගත් ආයතනයක් විසින් පවත්වන ලද පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුය. පෙර පාසල් පාලිකාවන් විසින් සපුරා ලිය යුතු අධ්‍යාපන අවශ්‍යතා

26. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පවත්වාගෙන යන ලද පෙර පාසල්වල. පාලිකාවන් හා ගුරුවරුන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ඉහත සුදුසුකම් සපුරා නොමැති නම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට වසර දෙකක් ඇතුළත නිසි බලධරයා විසින් නියම කරනු ලබන පිළිගත් ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් අධ්‍යාපන පාඨමාලාවක් සමත් විය යුතුය.

27. ඉහත සඳහන් පරිදි මූලික අධ්‍යාපන සුදුසුකම්වලින් තොරවූද, නිසි බලධරයා විසින් නියම කරනු ලබන කාලය තුළ මූලික අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීම අපොහොසත් වන්නා වූද පෙර පාසල් ගුරුවරුන් හෝ පාලිකාවන් වශයෙන් කටයුතු කරන අයවලුන් එකී කටයුතුවලින් ඉවත් විය යුතු අතර එසේ ඉවත් වන ලෙස නියෝග කිරීමට නිසි බලධරයාට බලය ඇත්තේ ය.

28. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පෞද්ගලිකව හෝ කිසියම් මධ්‍යස්ථානයක/පෙර පාසලක අධ්‍යයන කටයුතුවල නිරත වී සිටින සියලුම පෙර පාසල් පාලිකාවන් හා ගුරුවරුන් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට මාස හයක් ඇතුළත නිසි බලධරයා වෙත ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය. ඉන් පසු ඔවුන් වෙත හැඳුනුම්පත්‍රයක් ලබා දීමට කටයුතු කෙරේ.

29. බස්නාහිර පළාතේ පෙර පාසල් පාලිකාවන් පුහුණු කිරීම් කටයුතුවල යෙදෙන සෑම පුහුණු වීම් ආයතනයක්ම (ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතන හැර) නිසි බලධරයා වෙත අයදුම් කර ලියාපදිංචි විය යුතු අතර, ඒ සඳහා නිසි බලධරයා විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකයක් ලබා ගත යුතුය. පෙර පාසල් පාලිකා පුහුණුව

30. පෙර පාසල් පාලිකාවන් හා ගුරුවරුන් පුහුණුවට අදාළව විධිමත් වැඩ පිළිවෙළක් නිසි බලධාරියා විසින් සෑම වසරකම සකස් කර අනුමැතිය සඳහා පළාත් උපදේශකකමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

31. පළාත් උපදේශක කමිටුව වියින් මෙහෙයවනු ලබන පුහුණුවීම්වලට සහභාගි නොවන පෙර පාසල් පාලිකාවන්ගේ සේවය අත්හිටුවීමට නිසි බලධරයාට බලය ඇත.

32. පුහුණු වීම් අඛණ්ඩව කළ යුතු අතර. සෑම වසර තුනකට වරක් පෙර පාසැල් පාලිකාවන් හා ගුරුවරියන් පුහුණු කළ යුතුය.

33. පෙර පාසල් දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම සඳහා උපදේශක කමිටුවේද උපදෙස් පරිදි විධිමත් සැලැස්මක් නිසි බලධරයා විසින් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

## VII කොටස
## පොදු විධිවිධාන

34. (1) නියම කළ යුතු යැයි මේ ප්‍රඥප්තිය මගින් නියමිත හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය මගින් බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියලු කාරණා සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි බව.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළයුතු අතර, එය පළ කරනු ලැබීමේ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනනුමතයේ දිනයේ සිට එහෙත් එකී නියෝගය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්චින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(4) යම් නියෝගයක් පරිච්චින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

35. (1) මෙම ප්‍රඥප්තියේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහාද කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහාද බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ඊට අනුෂාංගික වන යම් කරුණකට අදළ වන අවශ්‍ය යැයි නිසි බලධරයා විසින් සලකනු ලබන රීති නිසි බලධරයා විසින් සාදනු ලැබිය හැකිය.

නිසි බලධරයාට රීති සෑදිය හැකි බව.

(2) නිසි බලධරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් උපදේශක කමිටවේ ද නිර්දේශ ලබාගෙන අනුමත කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

36. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා අදහස් කරන කවර හෝ පුද්ගලයකුගේ සේවය යම් නියමිත කාලසීමාවකට ලබා ගත හැකි අතර, නිසි බලධරයාට ආණ්ඩුකාරවරයා නියම කරනු ලබන දීමනාවක් ගෙවිය හැකිය.

37. ඇමතිතුමා විසින් හෝ උපදේශක කමිටුව විසින් නිසි බලධරයාට යම් නියෝගයක්, උපදෙසක්, මගපෙන්වීමක් කළ හොත් ඒ අනුව කටයුතු කිරීමටද යම් වාර්තාවක් හෝ ලේඛනයක් ඉල්ලා සිටියහොත් එය ලබා දීමටද බලධරයා විසින් කටයුතු කළ යුතුය.

## VIII කොටස
## වැරදි හා දණ්ඩන

38. මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සම්පාදනය කරන ලද නියෝග හෝ විධිවිධාන හෝ උල්ලංඝනය කිරීම කඩ කිරීම හෝ එම විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලය ඇති අයකුට තම රාජකාරි කටයුතු ඉටු කිරීමට බාධා කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේ ය.

39. එවැනි වරදක් සිදු කරන සෑම තැනැත්තෙකුටම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ කරනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු වුවහොත් ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහදහසක දඩයකට යටත් වීමට හෝ මාස හයකට නොවැඩි සිර දඬුවමකට යටත් වීමට හෝ එම දඬුවම් දෙකටම යටත් වීමට හෝ සිදු වන්නේ ය.

## IX - පොදු

40. 1990 අංක 05 දරණ බස්නාහිර පළාතේ අධ්‍යාපන ප්‍රඥප්තියේ 05 වන කොටස මේ ප්‍රඥප්තිය මගින් පරිච්ඡින්න කරනු ලැබේ.

41. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි
"අමාත්‍යවරයා" යන්නෙන් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.
"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාත් සභාව අදහස් වේ.

42. මෙම ප්‍රඥප්තියේ සිංහල, හා දෙමළ පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එහි සිංහල පාඨය බලපැවැත්විය යුතුය.

43. විශේෂ ළමුන් යන්නෙන් පෙර පාසල් යායුතු වයසේ සිටින පෙනීම, ඇසීම, දුබල වීම, කායික ආබාධිත තත්වයන් හා සෙමෙන් මනස වැඩෙන දරුවන් ආදි විශේෂිත ළමුන් අදහස් වේ.

# 1 වන උපලේඛණය
## ( පෙර පාසල් ලියාපදිංචි කිරීම / අළුතින් ඇරඹීම සඳහා ඉල්ලුම් පත්‍රය )

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.**

1. ඉල්ලුම් පත්‍රය ලැබුන දිනය :-
2. භාරගත් නිලධාරියාගේ අත්සන :-
3. ගෙවනලද ලියාපදිංචි ගාස්තුව:-රු.
4. මුදල් භාරගත් කුවිතාංසියේ අංකය:-
5. පෙර පාසල ලියාපදිංචි කළ දිනය:-
6. පෙර පාසල ලියාපදිංචි කරන ලදි/නොකරන ලදි

භාණ්ඩාගාරික නිලධාරියාගේ අත්සන

1. පෙර පාසල පිහිටුවීමට අදහස් කරන ස්ථානය :- ..........................................

2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ..........................................

3. ග්‍රාම නිලධාරි කොට්ඨාශය හා අංකය :- ..........................................

4. අධ්‍යාපන කලාප කාර්යාලය :- ..........................................

5. අධ්‍යාපන කොට්ඨාශ කාර්යාලය :- ..........................................

6. දැනට පවත්වාගෙන යන පෙර පාසලක්ද ? :- ..........................................

   අළුතින් ආරම්භ කරන පෙර පාසලක්ද ? :- ..........................................

7. පෙර පාසලේ නම හා ලිපිනය :- ..........................................

8. පෙර පාසල් අයිතිකරුගේ / පාලක මණ්ඩලයේ /

   ස්වේච්ඡා සංවිධානයේ නම හා ලිපිනය :- ..........................................

9. අළුතින් ආරම්භ කරන පෙරපාසලක් නම්

   මෙම ස්ථානය ඇරඹීමට යෝජිත දිනය :- ..........................................

10. පෙර පාසල් ගොඩනැගිල්ලේ කාමරවල වර්ග ප්‍රමාණය :- වර්ග අඩි

   .......... ..........................................

11. අපේක්ෂිත / දැනට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව :- ..........................................

12. පෙර පාසල ගුරුවරියන්ගේ නම් හා ලිපිනයන්

| පෙර පාසල ගුරුවරියන්ගේ නම් හා ලිපිනයන් | ලිපිනය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| .................................... | .................................... | .................................... |
| .................................... | .................................... | .................................... |
| .................................... | .................................... | .................................... |

13. පෙර පාසල සහායිකාවන් සිටින්නේ නම් සංඛ්‍යාව :- ..........................................

14. පෙර පාසල් පාලිකාවන්ට /සහායිකාවන්ට ගෙවීමට යෝජිත

   වැටුප / වැටුප ක්‍රමය :- ..........................................

15. පෙර පාසල පවත්වාගෙන යනු ලබන භාෂාය හෝ මාධ්‍යයන් :- ..........................................

16. පානීය ජල පහසුකම් / විදුලිය / වැසිකිළි පහසුකම් තිබේද? :- ..........................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.  .....................

දිනය ......................  අයදුම්කරුගේ අත්සන